WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,603 — 1958 නොවැම්බර් 28 වැනි සිකුරාදා — 28.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | 1122 |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 1119 | මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 1122 |



## අතුරු ව්‍යවස්ථා

ජීබී 14/31/3.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ගම් ප්‍රදේශයේ ගම්කායසී සභාව විසින් සම්පාදිතව 1947ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියේ 3 වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

නොවැම්බර් 14, 1958.

### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාව

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත් වූ යම් රථ වාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලන යෙහි තබාගෙන සිටින්නා වූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි සඳහන් "ඒ" උපලේඛනයෙහි පෝරමයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධාන තුමාට යැවිය යුතුයි. මේ පෝරම ගම්කායසී සභා කායසීලයෙන් ලබාගත හැක.

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වැනි වර්ෂය වෙනුවෙන් 1 වැනි ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණ කොට 1959 ජනවාරි මස 31 වැනි දින හෝ එයට මත්තෙන් ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලන යෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවා වූ සෑම අයෙක්ම තවදුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහා වූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු 31 වැනිදා හෝ එයට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව එකී වර්ෂයේ දවස් 30ට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු 31 වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දවූ ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථ වාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත් කරගෙන, තබා ගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමේ නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක

මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලෙඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දන්වීමකින් එසේ අත්පත් කර ගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධි විධානවලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයූ වාවූ සෑම අයෙක්ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන් ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නා වූ රථවාහන හා සතුන් සඳහා වූ බද්ද, ඒ සඳහා ප්‍රධාන තුමා විසින් දැනුම් දෙනු ලබන යම් කාලසීමාවක් ඇතුළත දී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් හේතුන් නිසායයි දැක්වෙන ලියවිල්ලකින් වූ දන්වීමක් වහාම ප්‍රධානතුමාට යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත් හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හල බව වහාම ප්‍රධානතුමා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

6. යම්කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධාන තුමා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු විසින් ඒ බද්ද ගෙවූ රථවාහන වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් කොට ඇති "බී" උපලේඛනයෙහි දැක්වෙන පරිදි ඒ ඒ රථවාහනය සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශෙෂ අකුරුද තහඩුව නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම් ද රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහන තහඩු පිළිබඳවූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නො පැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධාන තුමාට ආපසු බාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූවිට ඔහුට අලුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බැව් දිව්රුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැනීමට සැලැස්සුවහොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අලුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සෑම රථවාහනයක්ම අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව, ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් ඒ රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේ ය. තවද ප්‍රධානතුමා විසින් හෝ එකී නිලධාරියා විසින් හෝ ඉල්ලීමක් කර සිටින කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින්, ඒ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩ දිය යුතුයි.

9. වර්ෂ 1941ක් වූ මාර්තු මස 7 වැනි දින අංක 8,722 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා ඒවා අවලංගු කිරීමෙන් එම අතුරු ව්‍යවස්ථා මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ගම්කාරක සභාවට පමණක් අදාල වන පරිද්දෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් ගම්කාරක සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාරක සභාව" යනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

**පෝර්මය**

අංකය :———.

කොට්ඨාශයේ අංකය :———.

**අකුරැස්ස ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව**

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :———.

ගම :———.

තැපැල් :———.

| රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන වචනවලින් | වෙනත් විස්තර (බයිසිකලයක් නම් එහි වර්ගය හා නොම්මරය සඳහන් කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර ඕනෑම අන්දමක වාහන ... ... | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල | | |
| තනිගොනා බඳින බරබාගා හෝ තිරික්කල ... ... | | |
| අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ රථ ... ... | | |
| බයිසිකල් (සාදන ලද අයගේ අංකය සඳහන් කරනු) ... | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

මෙහි ඉහත සඳහන් විස්තර සෑම අතින්ම සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

අයිතිකාරයාගේ අත්සන :———.

දිනය :———.

* අනවශ්‍ය වචන කපා හරිනු.

## "බී" උපලේඛනය

**පෝර්මය**

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... | අ.ග.ස.වා. |
| ඕනෑම අන්දමක සෑම බරකරත්තයක් (ගොන් දෙන්නා බඳින) හෝ තිරික්කලයක් සඳහා ... | අ.ග.ස.බ.ක. |
| සෑම බරබාග කරත්තයක් (තනි ගොනා බඳින) හෝ තිරික්කලයක් සඳහා ... ... | අ.ග.ස.බ.බා. |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... | අ.ග.ස.රි. |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | අ.ග.ස.අ.ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | අ.ග.ස.බ. |

ඇල්/ජී/ඩී/-ජී.ජේ. 9/32.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ඕතර සහ ගම්දොළහ පත්තු ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 නොවැම්බර් මස 7 වැනි දින,
කොළඹ දීය.

## අතුරු ව්‍යවස්ථා

### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

1. (1) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ බාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් කොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝරමයේ ප්‍රකාර විස්තර උපලේඛනයක්, සභාපතිතුමාට සැපයිය යුතුයි. මේ ෆෝර්ම ගම්කාර්‍ය සභා කාර්‍යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපනතේ 47 වෙනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින්, 1959 වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනය සම්පූර්ණ කොට 1958 දෙසැම්බර් මස තිස් එක්වෙනි දිනට හෝ ඊට මත්තෙන් ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන්වත් එකී අයගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වෙනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) ඒ උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස තිස්එක්වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස තිස්එක්වෙනිදාට හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයූවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූද ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ 1 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථ වාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම්, එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු හෝ අත්පත්කර ගැනීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට හෝ පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් කොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝරමයේ ප්‍රකාරයට ලියවිල්ලකින්වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධාන තුමාට දැන්විය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්වූ 3වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලෙඛනය සැපයුවාවූ සෑම අයෙක්ම, එකී ලේඛන සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබූ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනයේ සිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහාවූ බද්ද ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම්දෙනු ලබන යම් කාලසීමාවක් තුළදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියකියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළා වූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වෙනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතු නිසායැයි දක්වෙන ලියකියවිල්ලකින්වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි.

(2) 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියකියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ රථවාහන හෝ සතා තබාගැනීමට හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින්වූ දැන්වීමක්, තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම හෝ නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම අත්හල බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූවිට ප්‍රධානතුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් කොට ඇති "බී" උපලේඛනයේ ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද, තහඩුව නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද, රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථ වාහන පිළිබඳවූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකීගොස් තිබෙතහොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් ලබාගැනීමට අයිතිවාසිකම් තිබේ.

7. සෑම රථවාහනයකම අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව, ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවි කළ යුතුය.

8. ප්‍රධාන තුමා විසින් හෝ එතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක්, ඒ රථවාහනයෙහි 7 වෙනි අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේ ය. තවද ප්‍රධාන තුමා විසින් හෝ නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටිය කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට හෝ එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩ දිය යුතුයි.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාර්‍ය සභාව" යනුවෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ ඕතර සහ ගම්දෙළහ පත්තු ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වෙනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

10. 1941 මාර්තු මස 14 වැනි දින අංක 8,724 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූ රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධවූ අතුරු ව්‍යවස්ථා, කෑගල්ල දිස්ත්‍රික්කයේ ඕතර සහ ගම්දොළහ පත්තු ගම්කාර්‍ය සභා ප්‍රදේශයට පමණක් අදාලවන පරිද්දෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### ෆෝර්මය

ඕතර සහ ගම්දොළහ පත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාර සැපයිය යුතු රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකරුගේ නම :————.

ඡන්දදායක කොට්ඨාශ අංකය :————.

ගම :————.

| රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන වචනවලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක වාහන ... | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... ... | | |
| තනි ගොනා බඳින බරබාගා කරත්ත හෝ තිරික්කල ... | | |
| අත්කරත්ත ... ... | | |
| ජීන් රික්ෂෝ කරත්ත ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සපයා ඇති තීරයේ සාදන ලද අයගේ අංකය සඳහන් කරනු) | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :————.

————,
අයිතිකරුගේ අත්සන.

* නුවුවමනා වචන කපාහරිනු

## "බී" උපලේඛනය

| | |
|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජීන් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන ... ... | ඕ. ග. ර. |
| ඕනෑම අන්දමක සෑම ගොන්දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | ඕ. ග. බ. ක. |
| සෑම තනිගොනා බඳින කරත්තයක් සඳහා ... ... | ඕ. ග. බා. ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... | ඕ. ග. බ. |
| සෑම අත්කරත්තයක් සඳහා ... | ඕ. ග. අ. ක. |
| සෑම ජීන්රික්ෂෝ කරත්තයක් සඳහා ... | ඕ. ග. රි. ක. |

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ

අංකය : බී. 8 (ඒ).

## කොලොන්නාව පළාත් ආණ්ඩු සභාව

පළාත් ආණ්ඩු සභාවේ මුදල් රෙගුලාසි 12(11) යටතේ ඉල්ලුම් පත්‍රයයි. වැය ශීර්ෂවලින් ඉතිරිවී ඇති මුදල් හිඟවූ වැය ශීර්ෂවලට ගෙන වියදම් කිරීම සඳහා පහත සඳහන් පරිදි සභාව තීරණය කරන ලදී :—

| ශීර්ෂය | ඉතිරිව | මුදල | ශීර්ෂය | වියදම | මුදල |
|---|---|---|---|---|---|
| ඒ 2 (සී) | ... අයබදු කොමිස් ... ... | 650 0 | ඒ 1 (ඒ) | ... ලේකම් වැටුප් ... ... | 650 0 |
| ඒ 6 (ජී) | ... සූතිකාධාර ... ... | 500 0 | ඒ 2 (ඊ) | ... නඩු වියදම ... ... | 500 0 |
| ඊ 6 (ජී) | ... සූතිකාධාර ... ... | 475 0 | බී 1 (ඒ) | ... අතිරේක දීමනා ... ... | 475 0 |
| ඊ 6 (සී) | ... අසරණාධාර ... ... | 215 0 | ඊ 5 (ඊ) | ... ගොඩනැගීම් ... ... | 215 0 |
| ඩී 7 | ... අභිනව වැඩ ... ... | 5,500 0 | බී 11 | ... මිණීම් ... ... ... | 5,500 0 |
| ජේ 2 (බී) | ... යන්ත්‍ර බොයිලර මැෂින් ... | 1,197 23 | ජේ4 (ඒ) | ... ලිපිකරු වැටුප් ... ... | 400 0 |
| | | | ජේ4 (සී) | ... වියදමට දෙන මුදල් ... ... | 7 50 |
| | | | ඒ 2 (ඇෆ්) | ... ලිපි ද්‍රව්‍යය ... ... | 500 0 |
| | | | ඒ 2 (කේ) | ... අතිකාල දීමනා ... ... | 9 64 |
| | | | ජේ5 (බී) | ... නය ආපසු ගෙවීම ... ... | 280 09 |
| | | 8,537 23 | | | 8,537 23 |

මෙම වැය ශීර්ෂ මාරු කිරීම 17.11.1958 වෙනි දින මෙම නගර සභාවේ පවත්වන ලද මාසික රැස්වීමේ සභා තීරණ අංක 18 යටතේ ස්ථිර කරන ලදී.

1958 නොවැම්බර් මස 20 වෙනි දින,
කොලොන්නාව පළාත් ආණ්ඩු සභා කාර්යාලයේදීය.

සී. අමරසිංහ,
කොළොන්නාව පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

---

# විවිධ දැන්වීම්

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිස්පනේ කෝරළේ ගම්කායයිි සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් අය විසින්, මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1959 වර්‍ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඬව නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිස්පනේ කෝරළේ ගම්කායයිි සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුන නිසායයි දක්ෘවන ලියවිල්ලක පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන ද සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධිත වූ අංක 6 ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. යූ. ජෙයිනුල් ආබ්දීන්, හපුගස්තලාව ... | අංක 48, කළුදමඩ, හපුගස් තලාව |
| 2. ඇන්. යූ. ලෙබ්බේ, හපුගස් තලාව ... | අංක ඩී. 79, කළුදමඩ, හපුගස් තලාව |
| 3. එම්. එම්. හනිෆා, හපුගස් තලාව ... | අංක 78, කළුදමඩ, හපුගස් තලාව |
| 4. ඇස්. ඇන්. ඇල්බට් ඩයස්, මල්ලන්ද, නාවලපිටිය ... | ස්ථානය : කළුදමඩ රුප්පේ කුඹුර. ස්ථානය : මල්ලන්ද. |

යූ. බී. ජයසුන්දර,
සභාපති තැන.

19.11.1958,
ගම්සභා කායයිාලය, තිස්පනේ,
වටද්දර.

---

## රම්බොඩගල්ල ගම්ප්‍රදේශයේ ගම්කායයිි සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1959 වර්‍ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධවන රම්බොඩගල්ල ගම්කායයිි සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණු නිසායයි දැක්වෙන ලියවිල්ලක්, පිටපත් දෙකක් සහිතව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥ පනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශොධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | | පිහිටි ස්ථානය |
|---|---|---|
| 1. කේ. අබ්දුල් හමීදු | ... | මන්දන්ඩාවල, පානගමුව |
| 2. ඇම්. ඇම්. තාහිර් | ... | වැලිකුඹුර, පානගමුව |
| 3. පී. යූනුස් | ... | පල්ලෙමුල්ල, පානගමුව |
| 4. ඇන්. ඇම්. වාහිදු | ... | රඹුකන්දන, මොරතිහ |

ඩබ්ලිව්. ඊ. වී. ඇස්. ද අල්විස්,
රම්බොඩගල්ල ගම් ප්‍රදේශයේ
පාලක නිලධාරිතැන.

18.11.1958,
ගම්කායයිි සභා කාර්යාලය,
දෙල්විට.

---

## වැඋඩ ගම්කායයිි සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1959 වර්‍ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස් කඩ පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන වැඋඩ ගම්කායයිි සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් එසේ විරුද්ධවීමට ඇති හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්කින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට මාසයක් ඇතුළතදී මා වෙත දැනුම්දිය යුතු බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (201 වැනි පරිච්ඡේදය) 6 වෙනි වගන්තිය යටතේ දැනුම්දෙනු ලැබේ.

ආර්. ආර්. ඩබ්ලිව්. රාජපක්ෂ,
වැඋඩ ගම්කායයිි සභාවේ සභාපති.

17.11.58,
ගම්කායයිි සභා කායයිාලය,
වැඋඩ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ විස්තර | ස්ථානය |
|---|---|---|
| 1. ඇම්. ඇබ්දුල් රසාක් ... | ගවයින් මැරීමට හා මස් වෙළඳාමට | පරගහදෙනිය. |
| 2. ඇස්. අබ්දුල් මජීඩ් ... | එම | පරගහදෙනිය |
| 3. යූ. ඇල්. ඇම්. කුද්දූස් | එම | පරගහදෙනිය |
| 4. ඇම්. කේ. ඔමරුජ කුබර් | එම | තල්ගස්පිටිය. |

## කම්මල්පත්තු ගම්කායයිි සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපණත

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛනයෙහි සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධ වන කම්මල් පත්තු ගම්කාර්ය සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවන දින සිට දහ හතර දිනක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මැරීම පිණිස ආඥපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥ පනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. අයි. හියු. ප්‍රනාන්දු,
කම්මල්පත්තු ගම්කායයිි සභාවේ ප්‍රධාන නැ.න.

වර්ෂ 1958ක්වූ නොවැම්බර් මස 15 වැනි දින,
කම්මල්පත්තු ගම්කායයිි සභා කාර්යාලයේදීය,
දුම්මලදෙනිය, වෙන්නප්පුව.

### උපලේඛනය

| ඉල්ලුම්කරු | පදිංචි ස්ථානය | මැරීමට අදහස් කරන සතුන් |
|---|---|---|
| 1. පී. ජෝන් ප්‍රනාන්දු ... | කවුනේරිය ... | හරක්, එළුවන් සහ ඌරන් |
| 2. ඩබ්ලිව්. ජෙරාඩ් තමෙල් | එම ... | එම |
| 3. ඇම්. මිගෙල් ප්‍රනාන්දු | එම ... | එම |
| 4. ඇම්. මිගෙල් ප්‍රනාන්දු | එම ... | එම |
| 5. ඇම්. ඒ. ප්‍රනාන්දු ... | එම ... | එම |
| 6. ඇස්. ආර්. ජේම්ස් අප්පුහාමි | එම ... | එම |
| 7. ඩබ්ලිව්. බෙන්ජමින් තමෙල් | එම ... | එම |
| 8. ඇස්. ඇලෝසියස් ප්‍රනාන්දු | උල්හිටියාව ... | එම |
| 9. ඩබ්ලිව්. ටී. මයිකල් ප්‍රනාන්දු | එම ... | එම |
| 10. කේ. කේ. ජෝන් ප්‍රනාන්දු | එම ... | එම |
| 11. ඩබ්ලිව්. මර්තේලිස් ප්‍රනාන්දු | උල්හිටියාව ... | හරක්, එළුවන් සහ ඌරන් |
| 12. ඩබ්ලිව්. ජී. නිකුලස් ප්‍රනාන්දු | එම ... | එම |
| 13. ජේ. කේ. ජිලට් පෙරේරා | වෙන්නප්පුව ... | එම |
| 14. ඩබ්ලිව්. කේ. මනුවෙල් ප්‍රනාන්දු | එම ... | එම |
| 15. ඇම්. ඒ. ජුවන් පෙරේරා | බොරලැස්ස ... | එම |
| 16. ඇස්. සිමියන් ප්‍රනාන්දු | එම ... | එම |
| 17. ජේ. කේ. ජෝශප් පෙරේරා | එම ... | එම |
| 18. ඇම්. ඇලෝසියස් ප්‍රනාන්දු | එම ... | එම |
| 19. ඩී. ජෝශප් පෙරේරා | නැ. නයිනමඩම | එම |
| 20. ඇම්. පීටර් ප්‍රනාන්දු ... | එම ... | එම |
| 21. ඩබ්ලිව්. පී. මනුවෙල් පෙරේරා | බ. නයිනමඩම ... | එම |
| 22. ඩබ්ලිව්. සිමියොන් වාස් | වයික්කාල ... | එම |
| 23. ඩබ්ලිව්. දමියානු වාස් ... | තෝප්පුතොට ... | එම |
| 24 ඩබ්ලිව්. ක්ලෙමෙන්තු ප්‍රනාන්දු | වයික්කාල ... | එම |
| 25. ඩබ්ලිව්. වින්සන් පෝල් තිසේරා | එම ... | එම |
| 26. ජේ. කේ. ලාසරස් පෙරේරා | බෝලවත්ත ... | එම |
| 27. කේ. ඩී. අනෝහාමි ... | අන්ගම්පිටිය ... | එම |
| 28. ආර්. ඇඩ්මන් ... | තඹරාවිල ... | එම |
| 29. ඇස්. ඒ. නෝබට් පෙරේරා | රන්ගම්මුල්ල ... | එම |
| 30. පී. ගිරිගෝරිස් ප්‍රනාන්දු | නැ. දුම්මල්දෙණිය | එම |
| 31. ඩබ්ලිව්. ඇස්. කුරේරා | කටුනේරිය ... | එම |
| 32. ඩබ්ලිව්. ජෝශප් ප්‍රනාන්දු | උල්හිටියාව ... | එම |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.